# 'බටහිර කුමන්ත්‍රණයට' එරෙහි බටහිර භූමිකාව

ඉකුත් සතියේ 'ඩේලි මිරර්' පත්‍රය හා සම්මුඛ සාකච්ඡාවකට එක් වෙමින් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මෙසේ කියා තිබිණ: ''අපිට වඩාත්ම තීරණාත්මක වන්නේ ඉන්දියාවයි....ඉන්දියාව 100%ක්ම ඉන්නේ අපි සමගයි....පාකිස්ථානය සහ චීනය සමග සම්බන්ධතාවක් පවත්වන්නට අපට සිදුව ඇත්තේ ඇයිද යන්නත් ඉන්දියාව හොඳින් වටහාගෙන තිබෙනවා. ඊළඟට එක්සත් ජනපදයත්, එක්සත් රාජධානියත්, යුරෝපා සංගමයත් ඉන්නවා. මේ සෑම රටක්ම ත්‍රස්තවාදීන්ට එරෙහි නීතිමය පියවර ගනිමින් සහ අරමුදල් රැස් කිරීම්වලට තිත තබමිනුයි ඉන්නේ. '' *(Daily Mirror - 19.09.2008)*

ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රකාශය ශ්‍රී ලංකා රජය සහ කලාපීය රාජ්‍යයන් අතර පවතින යහ සම්බන්ධතාව පමණක් නොව, අවශේෂ බටහිර රටවල් ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන අනුග්‍රහශීලී ආකල්පයද හොඳින් හකුළා පෙන්වන සුළු ය. නමුත් දකුණේ සාමාන්‍ය බහුතර ජනයාගේ විශ්වාසයන් ආරක්ෂක ලේකම්වරයාගේ ඉහත ප්‍රකාශයට පටහැනිව පිහිටා සිටියි. ඒ බහුතරයකගේ පිළිගැනීම වන්නේ 'රජයේ යුදමය ක්‍රියාමාර්ගයට එරෙහි බටහිර කුමන්ත්‍රණයක් ඇති බව ය. බටහිරට අවශ්‍යව ඇත්තේ කෙසේ හෝ හමුදා ක්‍රියාන්විතයන් අඩාල කොට කොටින් ගළවා ගැනීමත්, අනතුරුව ඔවුන් ශක්තිමත් කොට එමගින් ලංකා රාජ්‍යය දුබල කොට ශ්‍රී ලංකාව බෙදා වෙන් කිරීමත් බව ය.' මේ ජනප්‍රිය විශ්වාසයන් නිශ්චිත හා සංයුක්ත මූලාශ්‍ර පදනම් කරගෙන ගොඩනගන ලද ඒවා නොවේ. උපරිම තර්කානුකූල බවක් පෙන්වන අවස්ථාවලදී පවා, ඒවා පදනම් වන්නේ එක්කෝ කොළඹ තානාපති කාර්යාලයකින් නිකුත් කෙරෙන ප්‍රවෘත්ති නිවේදනයක් මත ය. නැතහොත් කිසි යම් බටහිර රටක පාර්ලිමේන්තු නියෝජිතයෙකුගේ ප්‍රකාශයක් මත ය. එසේත් නොවෙතොත් අන්තර් රාජ්‍ය නියෝජිත ආයතනයක හෝ රාජ්‍ය නොවන සංවිධානයක නිරීක්ෂණ වාර්තාවක් මත ය. නමුත් රාජ්‍ය තාන්ත්‍රික ප්‍රකාශ සහ රාජ්‍ය පිළිවෙත් යනු එකක් නොව, දෙකකි. ප්‍රවෘත්ති නිවේදන හෝ පුද්ගල ප්‍රකාශ මගින් රාජ්‍ය පිළිවෙත් පරාවර්තනය නොකෙරේ. එකී පිළිවෙත් කවරේද යන්න සැක හැර දැනගනු රිසි අයෙක් වේ නම් ඒ සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය පිළිවෙත් අන්තර්ගතව ඇති අප්‍රකට වාර්තා හා ලේඛන පිරික්සා බැලීමේ නීරස කාර්යය කළ යුතු ය. 'බටහිර කුමන්ත්‍රණයට' එරෙහිව ක්‍රියාත්මක ඇත්ත බටහිර භූමිකාව සැඟව ඇත්තේ ඒවා තුළ ය. 'ඊළමට එරෙහි ගෝලීය සන්ධානය' පිළිබඳ පරිපූර්ණ චිත්‍රය අනාවරණය කරගත හැක්කේ ඒ මගිනි.

**යුද්ධය සහ ඇමරිකානු පිළිවෙත**

අපි සිව්වෙනි ඊළම් යුද්ධය පිළිබඳ එක්සත් ජනපද පිළිවෙත විමසා බලමු.

සටන් විරාම ගිවිසුම අත්සන් කොට හත් මාසයක් ඇතුළත ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් ජනපද පැසිෆික් ආඥාවට අනුයුක්ත විශේෂ ආරක්ෂක දූත කණ්ඩායම විසින් 2002 ඔක්තෝබරයේදී ශ්‍රී ලංකා රජයට ඉදිරිපත් කරන ලද රහස්‍ය ඇගයුම් වාර්තාව පිළිබඳව මෙම ලිපි පෙළේ පළමු කොටසින් ('රාවය' - 2008 සැප්තැම්බර් 14 / පිටුව 06) පැහැදිලි කෙරිණ. විශේෂයෙන්ම නැගෙනහිර පළාතට අදාළව එකී වාර්තාවෙන් ඉදිරිපත් කෙරී තිබූ නිර්දේශ සහ 2006 ජූලියේදී සාම්පූර් හා නැගෙනහිර මුත්තූර් ප්‍රදේශ ඉලක්ක කොට දියත් වූ සිව්වන ඊළම් යුද්ධයේ ආරම්භක හමුදා ක්‍රියාන්විතයන් අතර පවතින 'විශ්මිත සම්බන්ධය' උක්ත ලිපියෙන් පැහැදිලි කොට තිබේ. නමුත් ඊළම් යුද්ධයේ ආරම්භයේ සිට ඉහත කී රහස්‍ය වාර්තාව දක්වා වූ සමස්ත කාල පරිච්ඡේදය තුළ එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකා රජය කෙරෙහි දක්වන ලද පූර්ණ අනුග්‍රහශීලී පිළිවෙත අමතක කළ ද, ඉකුත් තුන් වසර තුළ ඇමරිකානු භූමිකාව විමසා බැලීමට තරම් වටිනා එකකි.

චන්ද්‍රිකා කුමාරණතුංගගේ නායකත්වයෙන් යුතු එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය සහ එක්සත් ජනපදය අතර ත්‍රස්ත මර්දනය පිළිබඳ විශේෂ අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරුණේ 2005 ඔක්තෝබර් 27 වෙනිදා ය. මහින්ද රාජපක්ෂ ජනාධිපති ධූරයට තේරී පත්වූයේ එයින් සති තුනක් ඇවෑමෙනි. චාරිත්‍රානුකූලව ඉන්දියාවේ කළ පළමු දූත සංචාරයෙන් ඉක්බිතිව අභිනව ආණ්ඩුවේ විදේශ අමාත්‍ය මංගල සමරවීර 2006 ජනවාරියේදී එක්සත් ජනපද රාජ්‍ය බලධාරීන් මුණ ගැසුණේය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ත්‍රස්ත සංවිධාන පිළිබඳ ලැයිස්තුවෙන් දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය ඉවත් නොකරන ලෙස ඇමරිකානු බලධාරීන්ගෙන් ඉල්ලා සිටි හෙතෙම 'එක්සත් ජනපදය ලොව පුරා නව ප්‍රජාතන්ත්‍රයන් ප්‍රවර්ධනය කරන වකවානුවක තර්ජනයන්ට ලක්ව ඇති ශ්‍රී ලංකාව වැනි පවතින ප්‍රජාතන්ත්‍රයන් රැක බලා ගැනීම පැහැර හැරිය නොහැකි වගකීමක් බව' *IPS* ප්‍රවෘත්ති සේවයට ප්‍රකාශ කර තිබිණ. එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවට ලබාදෙන වාර්ෂික යුදමය ප්‍රතිපාදන දෙගුණයකින් වැඩි කිරීම මීට සමගාමීව සිදුවිය. *(US promises Sri Lanka aid against Tamil Tigers - Inter Press Service / 24.01.2006)*

ඒ අනුව විදේශ හමුදාවන් සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ වැඩසටහන *(FMF - Foreign Military Financing)* යටතේ 2005දී ශ්‍රී ලංකාවට ලබා දුන් ඩොලර් 496,000ක ප්‍රතිපාදනය 2006 වසරේදී ඩොලර් මිලියනයක් දක්වා ඉහළ නංවනු ලැබිණ. ඒ වනාහී සමාන්තර අවශේෂ යුද ආධාර වැඩසටහන් යටතේ වෙන් කෙරුණු ප්‍රතිපාදනයන්ට අමතර වශයෙනි. වැඩි කළ ප්‍රතිපාදන පිළිබඳ කරුණු පැහැදිලි කරමින් කතා කළ දකුණු ආසියානු කටයුතු පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍ය සහකාර ලේකම් ඩොනල්ඩ් කැම්ප් මෙසේ කියා තිබිණ: ''2006 මුදල් වර්ෂය සඳහා වැඩි කළ *FMF* මූල්‍ය ප්‍රතිපාදනය, ජාතික සහ කලාපීය ත්‍රස්ත කණ්ඩායම් විසින් ශ්‍රී ලංකා නාවුක හමුදාවට එල්ල කරනු ලබන තර්ජනයන්ට මුහුණ දීමට ආධාරක වනු ඇති අතර ශ්‍රී ලංකාවේ හමුදාවන් ප්‍රතිසංස්කරණය කොට වැඩි දියුණු කිරීමට ඉවහල් වනු ඇත.'' *(US lends Lanka more for arms - Tamil Guardian / 01.02.2006)*

නව වසරත් සමගම එක්සත් ජනපදයේ නව ගෝලීය යුද වැඩ පිළිවෙල තුළට ශ්‍රී ලංකාව වඩ වඩාත් වේගයෙන් ඇතුළත් කර ගැණුනි. ඒ යටතේ, ඇමරිකානු ජාතික න්‍යෂ්ටික ආරක්ෂණ පාලක මණ්ඩලය හා ඒකාබද්ධව දියත් කෙරුණු 'මෙගාපෝට්' ප්‍රාරම්භන වැඩසටහනට *(Megaport Initiative)* දකුණු සහ නැගෙනහිර ආසියාවෙන් ක්‍රියාකාරී ලෙස ඒකාබද්ධ කළ පළමු නැව් තොට බවට, ජනවාරි 26 වෙනිදා කොළඹ වරාය පත් විය. *(www.lankanewspapers.com/news/2006/1/5391.html)* එක්සත් ජනපද අභ්‍යන්තර ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුවට යටත් රේගු සහ දේශ සීමා ආරක්ෂණ බියුරෝව විසින් 2002 දී දියත් කළ බහාලුම් ආරක්ෂාව පිළිබඳ ප්‍රාරම්බන වැඩසටහන *(CSI - Container Security Initiative)* පිළිබඳ ගිවිසුමට ජූනි 25 වෙනිදා බ්‍රසල්ස් නුවර දී අත්සන් තැබූ ශ්‍රී ලංකාව ආසියාවේ අදාළ වැඩසටහනට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වූ පළමු රාජ්‍යය බවට ද පත්විය

*(www.un.org/events/smallarms2006/pdf/arms060626Sri-eng.pdf).*

මේ සැම සම්මුතියක් විසින්ම ඊට නියමිත ප්‍රතිලාභ ගෙන ආවේය. ජනවාරි 09 වෙනිදා කොළඹ ඇමරිකානු වාණිජ මණ්ඩල නියෝජිතයන්ගේ රැස්වීමක් අමතමින් කතා කළ කොළඹ ඇමරිකානු තානාපති ජෙෆ්රි ලුනස්ටඩ් 'කොටි සංවිධානය සාම මාවතින් පිට පනින්නේ නම් වඩා ශක්තිමත්, හැකියා පූර්ණ සහ අධිෂ්ඨානශීලී ශ්‍රී ලංකා හමුදාවකට මුහුණ දීමට ඔවුන්ට සිදුවනු ඇති බව'ට විවෘත අනතුරු හැඟවීමක් කළේය. ඇමරිකානු තානාපතිවරයාගේ ප්‍රකාශයට පැහැදිලි පදනමක් තිබිණ. ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ගේ නව ශක්‍යතා පිළිබඳ ඇමරිකානුවන්ට තිබූ අවබෝධයේ රහස ඇත්ත වශයෙන්ම සැඟව තිබුණේ 2002 සටන් විරාම ගිවිසුමෙන් පසු එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද විශේෂිත පිළිවෙත තුළ ය. 2007දී ආසියානු පදනම විසින් ප්‍රකාශයට පත්කළ වැදගත් ලියැවිල්ලක මෙකී පිළිවෙත තානාපති ලුනස්ටඩ් විසින් කදිම ලෙස පැහැදිලි කොට තිබේ: *'ශ්‍රී ලංකාව සමඟ වූ එක්සත් ජනපද යුදමය සබඳතා සටන් විරාම ගිවිසුමෙන් පසු ඉතා අඩු මට්ටමක සිට සැළකිය යුතු මට්ටමකින් ඉහළ නැංගේය. මෙම සබඳතා මගින් අරමුණු කරන ලද්දේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ශක්‍යතාවන් වඩාත් සවිමත් කිරීම ය. එමගින් (අ) කොටි සංවිධානය නැවත යුද්ධයට අවතීර්ණ වීම වැළැක්වීමත් (ආ) කොටි සංවිධානය එදිරිවාදිකම් යළි ආරම්භ කළහොත් ශ්‍රී ලංකා හමුදාවන්ගේ හැකියාවන් ඉහළින් පැවතීම සහතික කිරීමත් බලාපොරොත්තු විය.' (US Role in Sri Lanka's Peace Process 2002-2006: A Supplement Study to the Sri Lanka Strategic Assessment 2005 / 18 පිටුව)*

මේ යටතේ ශ්‍රී ලංකාව කෙරෙහි එක්සත් ජනපදය විසින් එතෙක් ලබාදුන් ආරක්ෂණ ප්‍රතිපාදන ඉහළ යාමේ ස්වභාවය තානාපති ලුනස්ටඩ් සිය ලියවිල්ලෙන් සවිස්තරාත්මකව පැහැදිලි කර දෙයි. ඒ අනුව විදේශ හමුදාවන් සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ වැඩසටහන *(FMF)* යටතේ 2002 - 2003 කාල සීමාව තුළ ඇමරිකාව ශ්‍රී ලංකා රජයේ හමුදාවන් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන්කොට නොතිබිණ. නමුත් 2004දී එය හිටි හැටියේ ඩොලර් මිලියන 2.5 දක්වා වැඩි කරනු ලැබිණ. අන්තර්ජාතික යුදමය අධ්‍යාපන සහ පුහුණුකිරීමේ වැඩසටහන *(IMET - International Military Education & Training)* යටතේ 2000 - 2002 කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට වෙන් කොට තිබු ප්‍රතිපාදනයන් ඩොලර් 200,000ත් - 250,000ත් අතරේ විය. එය 2003දී ඩොලර් 300,000ක් දක්වාත්, 2004-2006 අතර කාල සීමාවේදී ඩොලර් 450,000 - 500,000ක් දක්වාත් වැඩි කෙරිණ. එමෙන්ම ඒකාබද්ධ පුහුණු හුවමාරු වැඩසටහන *(JCET - Joint Combined Exchange Training)* යටතේ ශ්‍රී ලංකාව සමඟ ඒ වනවිටත් අරඹා තිබූ ඒකාබද්ධ යුද අභ්‍යාස වැඩ සටහන් පෙරට ගෙන යමින් කුඩා ඇමරිකානු හමුදා කණ්ඩායම් මගින් ශ්‍රී ලංකාව තුළ දී රජයේ හමුදාවන්ට ලබාදෙන පුහුණු පහසුකම් තීව්‍ර කෙරිණ. එක්සත් ජනපද හමුදා සහ ආරක්ෂක ප්‍රධානීන්ගේ නිරන්තර යාම් ඊම්වලට අමතරව, අතිරික්ත ආරක්ෂණ උපකරණ *(EDA - Excess Defense Articles)* ලැබීමට යෝග්‍ය රටක් වශයෙන්ද ශ්‍රී ලංකාව නම් කෙරිණ. ඇමරිකානු වෙරළාරක්ෂණ කටයුතු සඳහා යොදා ගැණුනු *'Courageous'* නාවුක යාත්‍රාව 2004 ජූනි මාසයේදී ශ්‍රී ලංකා නාවුක හමුදාවට නොමිලයේම ලබාදීමට එක්සත් ජනපදය ක්‍රියාකරන ලද්දේ මේ යටතේ ය. *(US Role in Sri Lanka's Peace Process 2002-2006 / 17-18 පිටු)*

**කල් දැමූ ආරක්ෂණ ගිවිසුම යළි කරළියට**

ඉහත කරුණු සියල්ල තිබියදී නව රජයේ යුදමය ක්‍රියා පිළිවෙත බටහිර අභිලාෂයන්ට එරෙහිව යන විජාතික විරෝධී මුහුණුවරක් සහිත එකක්ය යන ආකල්පය තවදුරටත් සිංහල පොදු ජන මනස තුළ මුල් බැස තිබේ. ඇතැම් විට රජයේත්, එහි ආධාරකාර දේශපාලන බලවේගයන් මෙන්ම යුදමය ක්‍රියාමාර්ගයට පක්ෂපාතී ජනමාධ්‍ය විසින්ද නිරන්තරයෙන් ගෙනයන ප්‍රචාරයන්ගේ බලපෑමෙන් මෙවැනි ආකල්පයක් තහවුරු වූවා යැයි සිතිය හැක. නමුත් 2005 වසර අවසානයේ බලයට පත් ජනාධිපති රාජපක්ෂගේ මූලිකත්වයෙන් යුතු අභිනව ආණ්ඩුව සිය යුදමය සැළසුම් ඇත්ත වශයෙන්ම ක්‍රියාවට නංවන ලද්දේ ඉන් දෙතුන් වසරකට පෙර සිටම ශක්තිමත් කෙරුණු ඉහත කී මූලික අඩිතාලමට බර දෙමිනි. වඩාත් සංයුක්ත ලෙස කිවහොත්, එක්සත් ජනපදය සමඟ එතෙක් පැවැති යුදමය සබඳතා සඳහා අත්‍යාවශ්‍යව තිබූ නමුත් දිගින් දිගටම කල් දැමුණු නීත්‍යානුකූල පදනම හරියාකාර ලෙස සම්පාදනය කරන ලද්දේ රාජපක්ෂ පාලන තන්ත්‍රය විසිනි. එහි ප්‍රතිඵලය, 2007 මාර්තු 05 වෙනිදා අත්සන් තැබුණු ශ්‍රී ලංකා - ඇමරිකානු ආරක්ෂක ගිවිසුමයි.

කොළඹ ඇමරිකානු තානාපතිවරයා සහ ආරක්ෂක ලේකම්වරයා අතර වැඩි හා හූවකින් තොරවම අත්සන් තැබුණු මෙකී 'පවරාගැනීමේ සහ සේවා හුවමාරු ගිවිසුම' *(Acquisition & Cross Servicing Agreement - ACSA)* සැළකිය යුතු අවධානයකට පාත්‍ර නොවුණු නමුත් අතිශයින් වැදගත් සම්මුතියකි. ගිවිසුමේ සැබෑ ඉතිහාසය සටන් විරාම ගිවිසුමේ ආරම්භය දක්වාම දිව යයි. ඇත්ත වශයෙන්ම ගිවිසුම අත්සන් කිරීමට යෝජනා වූයේ එක්සත් ජාතික පෙරමුණු පාලන සමයේ ය. ගිවිසුමේ මූලික කෙටුම්පත් සැකසීම අරමුණු කොටගත් සිවි පුද්ගල ඇමරිකානු දූත පිරිසක් 2002 අප්‍රේල් මාසයේ දී කොළඹට ළඟා වූයේ ඉන් මසකට පෙර එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ඇති කරගත් මූලික එකඟතා ප්‍රකාරව ය. නමුත් විරුද්ධ පාක්ෂික බලවේගයන්ගෙන් සහ විශේෂයෙන්ම ඉන්දියාව විසින් මතු කළ සැක සංකාවන් හේතුවෙන් ගිවිසුමේ කටයුතු අඩාල විණ.

ගිවිසුම පිළිබඳ අලුත් උණුසුමක් යළි මතුව ආයේ 2004 අප්‍රේල් 02 වෙනිදා චන්ද්‍රිකා කුමාරණතුංගගේ නායකත්වයෙන් යුතු එක්සත් ජනපතා නිදහස් පෙරමුණු රජය බලයට පත්වීමෙනි. ඒ වසරේ මැයි මාසයේදී නව රජයේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් එක්සත් ජනපද බලධාරීන් වොෂින්ටනයේදී මුණ ගැසුණු අතර 'පවරාගැනීමේ සහ සේවා හුවමාරු ගිවිසුම සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය කටයුතු නව ආණ්ඩුව වේගවත් කරනු ඇති බවට වොෂින්ටනය උදක්ම අපේක්ෂා කරතැ'යි කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලීය ප්‍රකාශකයෙකු කොළඹ සති අන්ත ඉංග්‍රීසි පුවත්පතකට ප්‍රකාශ කොට තිබිණ. නමුත් ගිවිසුම අත්සන් තැබීම යළි - යළිත් කල් තැබිණ. 2007 මාර්තු 05 වෙනිදා ගෝඨාභය රාජපක්ෂ සහ ඇමරිකානු තානාපති රොබට් ඕ. බ්ලේක් විසින් හිටිහැටියේ අත්සන් තබන ලද්දේ, වික්‍රමසිංහගේ හෝ කුමාරණතුංගගේ පාලන තන්ත්‍රයන්ට අත්සන් කරගත නොහැකිව අඛණ්ඩව කල් දමන ලද ගිවිසුමකට ය. ඒ අනුව ගිවිසගත් දෙපාර්ශ්වයට අවශ්‍ය කෙරෙන ලැගුම් පහසුකම්, වරාය සේවා, ගබඩා පහසුකම්, නඩත්තු කටයුතු, කඳවුරු මෙහෙයුම් ආධාර, පහසුකම් පරිහරණ අවස්ථා සහ පුහුණු සේවා පමණක් නොව, 'මාරක නොවන' අවි සහ පුපුරන ද්‍රව්‍යද අන්‍යෝන්‍ය වශයෙන් සපයා ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූල පදනම වැටිණ. නව ආරක්ෂණ එකඟතාව ඉක්මන් ප්‍රතිලාභ ළඟා කර දෙන බව නොපමාව ප්‍රත්‍යක්ෂ විය. ගිවිසුම අත්සන් කොට සතියක් ඇතුළත දී මන්නාරම් ද්‍රෝණියේ ඛණිජ තෙල් ගවේෂණ කටයුතු සඳහා ඩොලර් මිලියන 51ක ආධාර මුදලක් එක්සත් ජනපද වෙළඳ සහ සංවර්ධන ඒජන්සිය විසින්

මුදා හරින බවට නිවේදනය කෙරුණි.

කෙසේ වුවද, අත්සන් කෙරුණු ශ්‍රී ලංකා - ඇමරිකානු ආරක්ෂක ගිවිසුම ඒ වනවිටත් ඇරඹී තිබූ සිව්වෙනි ඊළම් යුද්ධයේ බල තුලනයට අදාළ තීරණාත්මක සංඥාවක් සේ සැළකිණ. ද්වි පාර්ශ්වික ආරක්ෂක සබඳතා තවදුරටත් පුළුල් කෙරුණේ ඒ අනුව  ය. නැගෙනහිර මෙහෙයුම්වලට අදාළ මූලික වටය අවසන් වූ ජූලි මාසයේදී කර්නල්වරයෙකුගේ නායකත්වයෙන් යුතු එක්සත් ජනපද මෙරීන් බලකායට අයත් සිවි පුද්ගල කණ්ඩායමක් නැගෙනහිර හමුදා පාලනයට නතු ප්‍රදේශයන්හී නිරීක්ෂණ චාරිකාවක නියැළිණ *(Daily Mirror - 28.07.2007)*. කොටි සංවිධානයේ පාලනයෙන් මුදාගත් ප්‍රදේශ හා එහි වසන ජනයා ඉලක්ක කොටගත් ප්‍රජා සෞඛ්‍ය සායන සහ සුබ සාධන කටයුතු පිළිබඳ පූර්ව සැළසුම් සකස් කිරීම ඇමරිකානුවන්ගේ නැගෙනහිර සංචාරයේ අරමුණු වශයෙන් ප්‍රකාශ කෙරුණි. නිරීක්ෂණ චාරිකාවෙන් මාසයක් ඉක්ම යන පමාවෙන් නව දෙනෙකුගෙන් සමන්විත එක්සත් ජනපද ගුවන් හමුදා වෛද්‍ය ඒකකයේ විශේෂ කණ්ඩායමක මූලිකත්වයෙන් ත්‍රිකුණාමල සහ මඩකළපු දිස්ත්‍රික්ක තුළ ප්‍රජා සෞඛ්‍ය වැඩ සටහන් සංවිධානය කරනු ලැබිණ. සැප්තැම්බර් 13 වෙනි දා කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලය විසින් නිකුත් කළ නිවේදනයකට අනුව ''**ශ්‍රී ලංකාවේ මෑතදී නිහස් කරගනු ලැබූ නැගෙනහිර පළාතේ කප්පාල්තුරෙ, ඊච්චලම්පත්තු සහ වාකරේ යන ප්‍රදේශ තුළ**'' ජීවත්වන සාමාන්‍ය ජනයා ඉලක්ක කොටගත් ප්‍රජා සෞඛ්‍ය වැඩ සටහන් ඇමරිකානු ගුවන් හමුදා සාමාජිකයින් විසින් පවත්වනු ලැබීය. වැඩ සටහන අවසානයේ ශ්‍රී ලංකා හමුදාවට අයත් සෙබළුන් 70 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකට සටන්වලදී තුවාල ලබන සහායක සෙබළුන්ට ප්‍රථමාධාර ලබාදීමට අදාළ ප්‍රායෝගික පුහුණු සැසියක්ද පැවැත්විණ.

**යුද තාක්ෂණික සහයෝගීතාව**

බැලූ බැල්මට අවධාරණය කෙරෙනුයේ ''යුදමය ක්‍රියාමාර්ග වෙනුවට දේශපාලන සාකච්ඡා ඇරඹිය යුතු'' බවට වන රාජ්‍ය තාන්ත්‍රික උපදේශන මාලාවන් ය. නමුත් ඒ යටින් දිවෙන ප්‍රායෝගික වැඩ පිළිවෙත් රජයේ යුදමය ක්‍රියාමාර්ග වෙත ස්ථාවර ආධාරකයක් බවට පත්ව තිබේ. මූල්‍යමය ප්‍රතිපාදන, ද්‍රව්‍යමය යුද ආධාර මෙන්ම ශ්‍රී ලංකා හමුදාවන්ගේ ප්‍රහාරක සහ තාක්ෂණික මට්ටම් වැඩි දියුණු කිරීමේ සැළසුම්ද මීට අයත් වේ. බටහිර පැසිෆික් සාගරයේ ගුවාම් හි ඇනඩර්සන් ගුවන් හමුදා කඳවුරෙන් 2009දී ගුවන් ගත කිරීමට සැළසුම් කොට ඇති අධි තාක්ෂණික ශක්‍යතා සහිත *Global Hawk* ඔත්තු නිරීක්ෂණ යානාව පිළිබඳ දැනටමත් ප්‍රකාශිත සැළසුම් එක් නිදසුනකි. අති සූක්ෂ්ම රේඩාර් නිරීක්ෂක හැකියාවෙන් සහ අධෝරක්ත සංවේදකවලින් සමන්විත මෙම යානාව පිළිබඳව රොයිටර් ප්‍රවෘත්ති සේවය විසින් විද්‍යුත් තැපැල ඔස්සේ මතු කරන ලද ප්‍රශ්නාවලියකට පිළිතුරු සපයන එක්සත් ජනපද පැසිෆික් ආඥාවේ ප්‍රකාශකයෙකුට අනුව 'ආසියා පැසිෆික් කලාපයේ රාජ්‍යයන් 11කට මෙකී යානාවේ තාක්ෂණික ශක්‍යතා භාවිතා කිරීමට අවකාශ සැළසීමට' එක්සත් ජනපදය තීරණය කොට තිබේ. ඉන්දියාව හැරුණු විට ඒ අතරට ඇතුළත් වන එකම දකුණු ආසියාතික රාජ්‍යය වන්නේ ශ්‍රී ලංකාවයි *(US seeks Asian partners for Global Hawk eye in sky -The Straits Times / 04.10.2007)*. ඒ වසරේම නොවැම්බර් මාසයේ ත්‍රිකුණාමලයේ නාවුක තටාකාංගණයේ පැවැති විශේෂ උත්සවයකදී ඇමරිකානු තානාපතිවරයා විසින් රේඩාර් මූලික නාවුක නිරීක්ෂණ පද්ධතියක් සහ නවීන ඩිංගි යාත්‍රා *(Rigid-Hulled Inflatable Boats - RHIB)* සමූහයක් ශ්‍රී ලංකා රජයේ නාවුක හමුදාව වෙත ප්‍රදානය කරන ලදී.

2008 ජනවාරි තුන්වෙනි සතියේ සිදු වූ එක්සත් ජනපද පැසිෆික් සේනාංක අණදෙන නිලධාරී අද්මිරාල් රොබට් එෆ්. විලාඩ්ගේ ලංකාගමනය පිළිබඳ තතුද මේ වර්ධනය වන සමීප සබඳතාවලට දෙස් දෙයි. ජනාධිපති රාජපක්ෂ හා අවශේෂ ආරක්ෂක ප්‍රධානීන්ද හමු වී සාකච්ඡා කළ අද්මිරාල් විලාඩ්ගේ චාරිකාව 'එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර පවතින නාවුක පුහුණු හා හුවමාරු වැඩ සටහන් ඇතුළු දැනට පවතින නාවුක සහයෝගිතා වැඩ සටහන් ප්‍රතිවිවරණය කිරීම' අරමුණු කොටගත්තක් බව තානාපති කාර්යාලය නිල වශයෙන්ම ප්‍රකාශ කරන ලදී. 'එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට එරෙහි ශ්‍රී ලංකා - ඇමරිකානු ඒකාබද්ධ සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස' ඔහු ත්‍රිකුණාමලය ප්‍රදේශයේදී නාවුක බලධාරීන් හමු වූ බවද අදාළ නිවේදනයේ වසන් කිරීමකින් තොරවම දැක් වේ. *(US Embassy Press Release / 18.01.2008)*

මේ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ සිව්වෙනි ඊළම් යුද්ධය ආරම්භයටත් පෙර සිටම යුදමය පිළිවෙතකට හිතකර වූ සමීප ආධාරක වැඩ පිළිවෙළක් එක්සත් ජනපදය අනුගමනය කළ බවය. එය කිසිසේත් දකුණේ බහුතරයක් දෙනා විශ්වාස කරන අන්දමේ යුදමය ක්‍රියාමාර්ගය කුමන්ත්‍රණකාරී ලෙස අවුරන එකක් නොවේ. ඇත්ත නම් එක්සත් ජනපදයේ විවෘත සහ ආවෘත දායකත්වය ශ්‍රී ලංකා රජයේ සන්නද්ධ හමුදාවන්ගේ ප්‍රහාරක ශක්‍යතා වර්ධනයට පැහැදිලි ලෙසම ඉවහල්ව ඇති බව ය. කාලාන්තර ඇගයුම් සහ උපදේශන ඇතුළත් ප්‍රායෝගික ආධාරක වැඩ සටහන් සහිත එය, රාජ්‍ය තාන්ත්‍රික නිවේදන මගින් හඟවනු ලබන 'මධ්‍යස්ථ - නිශ්ක්‍රීය' භූමිකාවට ඉඳුරාම වෙනස් එකකි. ඇමරිකානු කොංග්‍රස් පර්යේෂණ සේවාවේත්, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ හා ආරක්ෂක දෙපාර්තමේන්තුවේත් දීර්ඝ නීරස ලියැවිලි සහ අප්‍රකට වාර්තා කියවීමට අලස නොවන ඕනෑම අයෙකුට දෙරට අතර වර්ධනය වන සබඳතාවන්ගේ යථාව ස්වයංව ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. සිව්වෙනි ඊළම් යුද්ධයේ වේගවත් යුද ක්‍රියාන්විතයන් වළකාලීමට ගෙනයන 'බටහිර කුමන්ත්‍රණය' පිළිබඳ උද්වේගී ඝෝෂාවට යටපත් වූ ඇත්ත ගැබ්ව ඇත්තේ ඒවා තුළ ය. ඒ අතුරින් වැදගත් ලේඛණ දෙක තුනක්වත් කෙටියෙන් හෝ විමසා බැලීමට මෙතැන් සිට යොමුවීම ප්‍රයෝජනවත් වන්නේ එහෙයිනි.

**(මතු සම්බන්ධයි)**

**රවීස**
*raveesa@googlemail.com*

*රාවය / 2008 සැප්තැම්බර් 28*